## ආකෘති පත්‍රය සම්පූර්ණ කිරීමේදී සැලකිය යුතු කරුණු

- සම්පූර්ණ ආකෘති පත්‍රය පිරවිය යුතුය.
- 8-2 යටතේ මෙම නිවස තුල සිදු කරන ආර්ථික කටයුත්තේ ස්වභාවය පැහැදිලිව සඳහන් කළ යුතුය.
- මෙම නිවාස යෝජනා ලාභීන් සම්බන්ධයෙන් ඔවුන් තෝරා ගැනීමට හේතු සාධක පැහැදිලි ආකාරයෙන් ලිපියක් මගින් ඉදිරිපත් කළ යුතු අතර වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී, සමාජ සංවර්ධන සහකාර විසින් ඉදිරිපත් කරනු ලබන ලිපි අදාල ප්‍රජාමූල බැංකු කළමනාකරු/බැංකු සමිති කළමනාකරු විසින් නිර්දේශ කර ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියෙන් ඉදිරිපත් කළ යුතුය.
- සෑම අත්සනක් සඳහාම නිලමුද්‍රාව තැබිය යුතුය.
- ඉඩමේ අයිතිය තහවුරු කරගැනීමේදී "සින්නක්කර" හෝ "වෙනත්" යන්න පැහැදිලිව සටහන් කළ යුතුය.
- අනවසර ඉඩම් හිමියන් තෝරා නොගත යුතු අතර "වෙනත්" යන කරුණ යටතේ බලපත්‍රලාභීන්ද යන්න නිතීඥවරයකුගේ හෝ සාමදාන විනිශ්චයකරුවකු විසින් තහවුරු කළ යුතුය.
- තනි අයිතිය යටතේ ඉඩම් තෝරා ගැනීම වඩාත් සුදුසු වන අතර නොඑසේ නම් නිරවුල්භාවය පිළිබඳ අදාල ඔප්පු පිටපත් ලබාදිය යුතුය.